(21)

# ඉතා වැදගත්

පොදු උපදෙස් පත්‍රිකා 02/2020

මගේ අංකය-දපස/සමු.සං/සං/18
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,ගාල්ල
2020.07. 22

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ගාල්ල/මාතර/හම්බන්තොට)
අධිකරණ කටයුතු බාර දිස්ත්‍රික් නිලධාරීන්,
අධිකරණ කටයුතු බාර මූලස්ථාන සංවර්ධන නිලධාරීන් ඇතුළු
අධිකරණ කටයුතු සඳහා සහභාගී වන සියළුම දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත.

**<u>දෙපාර්තමේන්තුව වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීමේදී අනුගමනය කල යුතු පොදු උපදෙස්</u>**

සමුපකාර සමිති පනතේ 58 වගන්තිය යටතේ බේරුම්කරු විසින් හෝ ම විසින් ලබා දෙන ලද තීරණයක් අනුව ඒ පාර්ශවයන් ක්‍රියා නොකරන විට ම විසින් හෝ දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් විසින් එම පනතේම 59 වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණ හෝ දිසා අධිකරණ වෙත ආරවුල් යොමු කරන අතර එහිදී මා වෙනුවෙන් හෝ දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් වෙනුවෙන් පෙනී සිටීම මෙන්ම විවිධ පාර්ශවයන් විසින් මා හෝ දෙපාර්තමේන්තුව වගඋත්තරකරුවෙකු කර ගොනු කරනු ලබන නඩු වලදී එම පාර්ශවයන් වෙනුවෙන් පෙනී සිටීම ඔබ විසින් සිදු කරනු ලබයි.

(i) එහිදී අදාල නඩු වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම, අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීම, නඩුවට අදාලව අධිකරණයේදී ඉදිරිපත් වන කරුණු සම්බන්ධයෙන් මා හෝ සහකාර කොමසාරිස්වරුන් දැනුවත් කර උපදෙස් ලබා ගැනීම හා ලැබෙන උපදෙස් අනුව ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ඔබ විසින් සිදු කරනු ලබයි.

(ii) උක්ත කාර්යන් ඉටු කිරීමේදී ඔබ විසින් පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙසත් ගැටළුවක් ඇති වන අවස්ථාවකදීම මා හෝ සහකාර කොමසාරිස් දැනුවත් කර කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් මෙයින් දන්වමි.

- සමුපකාර පනතේ 59 වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණ හෝ දිසා අධිකරණ වෙත යොමු කිරීම සඳහා ආරවුල් කාර්යාලය මගින් ඔබ වෙත ලබා දුන් පසු පරීක්ෂා කර බලා කඩිනමින් එම ගොනු අධිකරණය වෙත යොමු කර එම ගොනු වලට අදාල නඩු අංක හා නඩු කැඳවන දිනය කාර්යාලයේ එම විෂය කටයුතු සිදු කරන නිලධාරියාට ලබා දිය යුතුවේ. තවද අධිකරණයෙන් අවස්ථාව ලැබෙන පරිදි හැකි උපරිම නඩු ප්‍රමාණයක් ගොනු කර කාර්යාලයේ පවතින උසාවි ගත කිරීමට ඇති ආරවුල් සංඛ්‍යාව අවම කර ගැනීමට සහයෝගය ලබා දිය යුතුවේ.

- නව නඩු කැඳවන දිනයන් මෙන්ම පවතින නඩු වල ඉදිරි දිනයන් පිළිබඳව උසාවි නිලධාරී දැඩි අවධානයෙන් සිටිය යුතු අතර ඒ සෑම දිනයකදීම උසාවි නිලධාරී නියමිත වේලාවට අධිකරණයේ පෙනී සිට සෑම නඩුවක් සඳහාම අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. ඒ එක් එක් නඩු වලදී අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලබන නියෝග අනුව අවශ්‍ය වන සුදුසු ඉදිරි පියවර ගත යුතුය. ඒ සඳහා නඩුවට අදාල ආරවුල යොමු කර ඇති සමිතිය සම්බන්ධ කර ගත යුතු වන්නේ නම් සමිතිය මගින් අවශ්‍ය සහයෝගය ලබා ගත යුතුය.(උදා. වගඋත්තරකරුවන්ගේ ලිපින සොයා ගැනීම) තවද අධිකරණ කටයුතු සඳහා සහභාගී වීමේදී අවශ්‍ය සියළුම තොරතුරු හා ලේඛණ, සමුපකාර සමිති පනත හා එහි සංශෝධන, රීති මාලාව රැගෙන යා යුතු අතර ගරු අධිකරණය විසින් විමසන කරුණු සම්බන්ධයෙන් සුදුසු පිළිතුරු ලබා දිය යුතු අතර, එම අවස්ථාවේ පිළිතුරු ලබා දිය නොහැකි විමසීම් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට ඉදිරි දිනයක් ඉල්ලා සිටිය යුතුය. ඉන් පසු අවශ්‍ය උපදෙස් ලබා ගෙන නියමිත දින ගරු අධිකරණයට කරුණු වාර්තා කල යුතුය.

- නොවැලැක්විය හැකි යම් අවස්ථාවක අධිකරණ කටයුතු සඳහා සහභාගී වීමට නොහැකි වන්නේ නම් ප්‍රමාණවත් කාලයකට පෙර ඒ බව සහකාර කොමසාරිස් වෙත දැනුම්දී වෙනත් නිලධාරියෙකු ඒ සඳහා යෙදවිය යුතු අතර එම නිලධාරියාට එදින නඩු වලට අදාල අවශ්‍ය උපදෙස් හා ලිපි ලේඛණ ලබා දිය යුතුය.

- යම් නඩුවකට අදාලව විත්තිකරුවන් විසින් ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කරන්නේ නම් පැමිණිලිකරු වෙනුවෙන් ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ගරු අධිකරණයෙන් ඉල්ලා සිටිය යුතු අතර ඒ සඳහා ඉදිරි දිනයක් ලබා ගත යුතුවේ. තවද විත්තිකරු විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත කරුණු දැක්වීම් වල පිටපත් ඉල්ලා සිටිය යුතුය. එලෙසම විත්තිකරුවන් විසින් යම් නඩුවකට අදාලව විරෝධතා ඉදිරිපත් කරන්නේ නම් පෙර පරිදි එහි පිටපතක් ඉල්ලා සිටිය යුතු අතර ප්‍රති විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා ඉදිරි දිනයක් ලබා ගත යුතුය.

- යම් අවස්ථාවක විවෘත අධිකරණයේදී ඉහත පරිදි විත්තිකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත කරුණු දැක්වීම් වල හෝ විරෝධතා වල පිටපත් නොලැබුණු විට එදිනම ඒ බව සහකාර කොමසාරිස් වෙත වාර්තා කර ඊට පසු දිනම එහි පිටපතක් ඉල්ලා ලිපියක් අධිකරණ රෙජිස්ට්‍රාර් වෙත යොමු කල යුතුය. එලෙස ලිපියක් රෙජිස්ට්‍රාර් වෙත බාර දීමෙන් පසු කඩිනමින් එම පිටපත් ලබා ගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

- එලෙස ලිඛිත කරුණු දැක්වීම් හෝ ප්‍රති විරෝධතා ඉදිරිපත් කරන ලෙස පැමිණිලිකරුට ගරු අධිකරණය මගින් නියෝග කර ඇති විට නියමිත දිනයේ එම කරුණු දැක්වීම් හෝ ප්‍රති විරෝධතා ඉදිරිපත් කල යුතු අතර, එසේ කිරීම සඳහා අවශ්‍ය පාර්ශවයන් සමග සම්බන්ධ වී නියමිත දිනට පෙර කරුණු දැක්වීම් හෝ ප්‍රති විරෝධතා සකස් කර ගත යුතුය. යම් අවස්ථාවක එලෙස නියමිත දිනට පෙර කරුණු දැක්වීම් හෝ ප්‍රති විරෝධතා සකස් කර ගැනීමට නොහැකි වන්නේ නම් ඒ බව අධිකරණය වෙත ලිඛිතව වාර්තා කර කරුණු දැක්වීම් හෝ ප්‍රති විරෝධතා ඉදිරිපත් කිරීමට වෙනත් දිනයක් ලබා ගත යුතුය.

- සකස් කර ගනු ලබන කරුණු දැක්වීම් හෝ ප්‍රති විරෝධතා වල නියමිත පරිදි අත්සන් කර අවශ්‍ය වන අවස්ථාවන්හිදී දිවුරුම් ප්‍රකාශ සහිතව අධිකරණය වෙත යොමු කල යුතු අතර ඉදිරිපත් කිරීමට ප්‍රථම ඒවායේ අන්තර්ගත කරුණු නිවැරදි බවට සනාථ කර ගැනීම මෙන්ම අවශ්‍ය සියළුම ලේඛණ වල සහතික පිටපත් සහිතව ගොනු කිරීම කල යුතුය.

- යම් නඩුවකට අදාලව ලිඛිත කරුණු දැක්වීම් හෝ ප්‍රති විරෝධතා වලට අමතරව ලිඛිත දේශණ ඉදිරිපත් කිරීම සඳහා ගරු අධිකරණය විසින් නියෝග කර ඇත්නම් ඉහත පරිදිම නියමිත දින ලිඛිත දේශණ ගොනු කිරීමට කටයුතු කල යුතුය.

- යම් නඩුවකට අදාලව ගරු අධිකරණය විසින් අවසන් නියෝගයක් ලබා දුන් පසු ඊට එරෙහිව දින 14 ක් ඇතුළත අභියාචනයක් ගොනු කල යුතු බැවින් ඊට පසු දිනම නියෝගයේ/ කාර්ය සටහන් හා සටහන් වල සහතික පිටපතක් ඉල්ලා අධිකරණ රෙජිස්ට්‍රාර් වෙත ලිපියක් බාරදී එම ලේඛණ කඩිනමින් ලබා ගැනීමට කටයුතු කල යුතු අතර අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා කඩිනමින් මා වෙත යොමු කල යුතුය.

- දෙපාර්තමේන්තුවේ නඩු වලට අදාලව ගරු අධිකරණය තුළ සාකච්ඡා වන මා හෝ සහකාර කොමසාරිස් වෙත දැන්විය යුත යැයි ඔබ අපේක්ෂා කරන සියළුම කරුණු නොපමාව මා හෝ සහකාර කොමසාරිස් වෙත වාර්තා කල යුතුය.

ආර්.ජී. කන්නන්ගර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

පිටපත්-

01. ලේකම්, කෘෂිකර්ම...සමුපකාර අමාත්‍යාංශය, ලබුදූව - කාරු.දැ. පි